සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර 01 විභාගය - 2026 ජූලි

(1901) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2026-08-01
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

<u>A කොටස</u>

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

01 වන ප්‍රශ්නය

අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ කුමක් ද?

(1) ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීමයි.

(2) වැදගත් ආර්ථික තීරණ ගැනීම සඳහා ඇල්මැති පාර්ශවයන්ට මූල්‍ය තොරතුරු සන්නිවේදනය කිරීමයි.

(3) ව්‍යාපාරයේ වියදම් අඩු කිරීම සහ ආදායම් වැඩි කිරීමයි.

(4) වාර්ෂික ආදායම් වාර්තාව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමයි.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණයේ මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) ආදායම.

(2) වත්කම්.

(3) වගකීම්.

(4) ශේෂ පිරික්සුම.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ යෙදවුමක් ලෙස සලකනු ලබන්නේ කුමක් ද?

(1) රු.1,000,000/- කට මෝටර් රථයක් මිලට ගැනීම, වත්කමක් ලෙස වාර්තා කිරීම.

(2) මාසය සඳහා වූ රු.500,000/- ක මුළු ණයට විකුණුම් වට්ටෝරුව, විකුණුම් ගිණුමට මාරු කිරීම.

(3) ගින්නක් හේතුවෙන් රු.30,000/- ක් වටිනා තොග අලාභය.

(4) ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පිළියෙල කිරීම.

1.4 පහත සඳහන් තොරතුරු, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කේවලස්වාමි ව්‍යාපාරයක් වන **සමන් ට්‍රේඩර්ස්** හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදි:

	රු.
2025 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය	5,000,000
2026 මාර්තු 31 දිනට මුළු වත්කම්	8,500,000
වර්ෂය තුළදී හඳුන්වා දුන් අමතර ප්‍රාග්ධනය	500,000
වර්ෂය තුළදී සිදුකළ ගැනීම්	600,000
2026 මාර්තු 31 දිනට වගකීම්	2,000,000

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සමන් ට්‍රේඩර්ස්** හි ලාභය වූයේ:

(1) රු.400,000/-. (2) රු.1,500,000/-. (3) රු.1,600,000/-. (4) රු.1,400,000/-.

1.5 දේපළ, පිරියත සහ උපකරණ, ණයට ගැනීමක් සටහන් කිරීමට යොදාගන්නා මූලාශ්‍ර ලියවිල්ල වන්නේ:

(1) ගැනුම් ඉන්වොයිසියයි. (2) ජර්නල් වවුචරයයි.

(3) ගෙවීම් වවුචරයයි. (4) බැර පතයි.

1.6 පාරිසරික දැනුවත්භාවය සහ පුනර්ජනනීය බලශක්තිය සඳහා රජයේ දිරි ගැන්වීම් සැලකිල්ලට ගනිමින් කාබන් පිය සටහන් (carbon footprint) ඉලක්ක සපුරා ගැනීම සඳහා **සීමාසහිත නිමල් (පෞද්ගලික) සමාගම** සූර්ය බලශක්තිය සඳහා ආයෝජනය කිරීමට තීරණය කරයි.

ඉහත සඳහන් තොරතුරු පදනම් කර ගනිමින්, PESTEL සාධකවල, වඩාත් සුදුසු වන්නේ කුමන සංයෝජනය ද?

(1) පාරිසරික සහ දේශපාලනික සාධක. (2) දේශපාලනික සහ සමාජයීය සාධක.

(3) තාක්ෂණික සහ නෛතික සාධක. (4) තාක්ෂණික සහ සමාජයීය සාධක.

1.7 ව්‍යාපාරයේ බැංකු ණයක ප්‍රාග්ධන කොටස පියවීම සඳහා රු.50,000/- ක් මුදලින් ගෙවා තිබේ. පහත සඳහන් ඒවා අතුරෙන්, මෙම ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම තෝරන්න:

(1) රු.50,000/- කින් වත්කම් අඩුවීම සහ රු.50,000/- කින් ප්‍රාග්ධනය අඩුවීම.

(2) රු.50,000/- කින් වත්කම් අඩුවීම සහ රු.50,000/- කින් වගකීම් අඩුවීම.

(3) රු.50,000/- කින් වත්කම් වැඩිවීම සහ රු.50,000/- කින් වගකීම් වැඩිවීම.

(4) රු.50,000/- කින් වගකීම් වැඩිවීම සහ රු.50,000/- කින් ප්‍රාග්ධනය අඩුවීම.

1.8 පහත සඳහන් ගිණුම්කරණ සැලකීම් අතුරෙන්, ආරක්ෂණ සංකල්පය (Prudence Concept) සම්බන්ධයෙන්, නිවැරදි වන්නේ කුමක් ද?

(1) මුදල් ලැබීම හෝ නොලැබීම නොසලකා හරිමින්, නිශ්චිත ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ ආදායම / අයභාරය හඳුනා ගනු ලැබේ.

(2) අත්පත් කරගැනීමේ පිරිවැය පදනම් කර ගනිමින්, අස්තිත්වයක වත්කම්වල වටිනාකම සටහන් කරනු ලැබේ.

(3) විකුණුම් පිරිවැය, විකුණුම් ආදායම සමඟ සංසන්දනය කළ යුතුය.

(4) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය [Cost or Net Receivable Value (NRV)] යන දෙකෙන් අඩු අගයට තොග අගය කරනු ලබයි.

1.9 අයිතිකරු ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා ව්‍යාපාරයෙන් රු.20,000/- ක් මුදලින් ලබාගන්නා ලදි. මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ:

(1) මුදල් ගිණුම හර - රු.20,000/- සහ ප්‍රාග්ධන ගිණුම බැර - රු.20,000/-.

(2) මුදල් ගිණුම හර - රු.20,000/- සහ ගැනිලි ගිණුම බැර - රු.20,000/-.

(3) ගැනිලි ගිණුම හර - රු.20,000/- සහ මුදල් ගිණුම බැර - රු.20,000/-.

(4) ගැනිලි ගිණුම හර - රු.20,000/- සහ ප්‍රාග්ධන ගිණුම බැර - රු.20,000/-.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ භාවිත වන පොදු ගිණුම්කරණ මෘදුකාංගයක් සඳහා උදාහරණයක් **නොවන්නේ** කුමක් ද?

(1) තොග පාලන පද්ධතිය. (2) සේජ් (SAGE).

(3) ක්වික් බුක් (Quick Book). (4) ඇක්පැක් (ACCPAC).

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 හෙළිදරව් කිරීමේ සංකල්පයට අනුව, තීරණ ගැනීමේදී අදාල වන සියළු ප්‍රමාණාත්මක තොරතුරු අත් නොහැර හෙළිදරව් කළ යුතු වේ.

1.12 අස්තිත්වයක ශේෂ පිරික්සුම සමාන වීමෙන්, ලෙජර්වල සියළු ගිණුම්කරණ වැරදි අනාවරණය කරගත් බව සහතික කරයි.

1.13 මුදල් ගිණුම හා කාර්යාල උපකරණ ගිණුම, නාමමාත්‍ර ගිණුම් සඳහා උදාහරණ වේ.

1.14 පොදු ජර්නලය, මූලික සටහන් පොතකි.

1.15 රහස්‍යභාවය යනු ගිණුම්කරණ ශිල්පියෙකු විසින් අනුගමනය කරනු ලබන ආචාරධර්ම සංග්‍රහයේ මූලික මූලධර්මයකි.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 අස්තිත්වයක් විසින් පරිගණකගත ගිණුම්කරණ පද්ධතියකට මාරු වීමට හේතු දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.17 "වගකීමක්" යන පදය නිර්වචනය කරන්න.

1.18 මූලාශ්‍ර ලේඛනයක ඇතුළත් වන කරුණු / අයිතම දෙකක්(02) සඳහන් කරන්න.

1.19 මූලික සටහන් පොත් පවත්වා ගැනීමේ අරමුණු දෙකක්(02) සඳහන් කරන්න.

1.20 පහත සඳහන් තොරතුරු, **ABC ට්‍රේඩර්ස්හි** පොත්වලින් 2026 මාර්තු මාසය සඳහා උපුටාගන්නා ලදී:

	රු.
2026 මාර්තු 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැතියෝ) පාලන ගිණුමේ ශේෂය	1,400,000
මාසය සඳහා දෛනික විකුණුම් පොතේ එකතුව	6,000,000
මාසය තුළදී ලියාහරින ලද බොල්ණය	400,000
මාසය තුළදී ණයගැතියන්ගෙන් ලැබුණු මුදල්	4,800,000

2026 මාර්තු 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැති) පාලන ගිණුමේ ශේෂය හඳුනා දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

A කොටසෙහි අවසානය

B කොටස

(මුළු ලකුණු 40)

02 වන ප්‍රශ්නය

(A) **සෙහන්සා ට්‍රේඩර්ස්,** සීනි තොග වශයෙන් විකිණීමේ ව්‍යාපාරයේ නිරත වන කේවලස්වාමි ව්‍යාපාරයකි.

පහත සඳහන් තොරතුරු, 2026 මැයි මාසයේදී සිදුකළ ණයට ගැනුම් සම්බන්ධව වේ:

දිනය	ඉන්වොයිස් අංකය	සැපයුම්කරු	ප්‍රමාණය (කිලෝග්‍රෑම්)	කිලෝග්‍රෑමයක මිල (රු.)	වෙළෙඳ වට්ටම
2026.05.01	1245	සීමාසහිත BRC (පෞද්ගලික) සමාගම	3,000	190/-	-
2026.05.09	14879	ශාන් සප්ලයර්ස්	4,000	230/-	5%
2026.05.19	0025	සිටි ඩිස්ට්‍රිබියුටර්ස්	2,500	190/-	-
2026.05.23	14885	ශාන් සප්ලයර්ස්	1,500	230/-	5%

ඉහත සඳහන් තොරතුරු පදනම් කර ගනිමින්,

ඔබ විසින් කළ යුතු දෑ:

2026 මැයි මාසය සඳහා ඉහත සඳහන් ගනුදෙනු වාර්තා කිරීමට **සෙහන්සා ට්‍රේඩර්ස්හි** දෛනික ගැනුම් පොත (ගැනුම් ජර්නලය) **පිළියෙල කරන්න.** (ලකුණු 05)

(B) 2026 මාර්තු 31 දිනට, **සුපර් ට්‍රේඩර්ස්හි** බැංකු ප්‍රකාශනයේ රු.100,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) රු.185,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්විය.

වෙනස සඳහා පහත සඳහන් හේතු හඳුනාගන්නා ලදී:

(1) 2026 මාර්තු 30 දින, රු.25,000/- ක චෙක්පතක් සැපයුම්කරුවෙකුට නිකුත් කළ නමුත්, එය 2026 මාර්තු 31 දින වන විට ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත.

(2) බැංකුවට ලබා දී තිබූ ස්ථාවර නියෝග උපදෙස් අනුව, බැංකුව විසින් රු.50,000/- ක ණය වාරිකය හර කර තිබේ. නමුත්, මෙය මුදල් පොතේ සැලකිල්ලට ගෙන නොමැත.

(3) ණයගැතියෙකුගෙන් ලැබුණු රු.60,000/- ක චෙක්පතක්, 2026 මාර්තු 30 දින බැංකුවේ තැන්පත් කර ඇත. කෙසේවුවද, එය 2026 මාර්තු 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(4) බැංකුව, මාසය සඳහා බැංකු ගාස්තු වශයෙන් රු.15,000/- ක් හර කර තිබේ. කෙසේවුවද, මෙය මුදල් පොතේ සටහන් කර නොමැත.

(5) ගනුදෙනුකරුවෙක් රු.15,000/- ක් ඍජුවම බැංකු ගිණුමට තැන්පත් කර තිබේ. කෙසේවුවද, මෙම ගනුදෙනුව මුදල් පොතේ සටහන් කර නොමැත.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2026 මාර්තු 31 දිනට, බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

03 වන ප්‍රශ්නය

දසුන්, 2025 දෙසැම්බර් 01 දින ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2025 දෙසැම්බර් මාසය තුළදී පහත සඳහන් ගනුදෙනු සිදුවී ඇත:

(1) 2025 දෙසැම්බර් 01 දින, මුදලින් රු.1,800,000/- ක් සහ රු.2,000,000/- ක් වටිනා මොටර් රථයක් මූලික ප්‍රාග්ධනය වශයෙන් **දසුන්** යොදවා ඇත.

(2) නැවත විකිණීම සඳහා රු.1,700,000/- ක් වටිනා භාණ්ඩ, **ශක්ති ට්‍රේඩර්ස්** වෙතින් ණයට ගන්නා ලදී.

(3) රු.700,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, රු.1,100,000/- කට ණයට විකුණන ලදී. තවද, රු.200,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, රු.300,000/- ක අත්පිට මුදලට විකුණන ලදී.

(4) රු.25,000/- ක් වූ ව්‍යාපාරයේ විදුලි බිල, **දසුන්** ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවන ලදී.

(5) **ශක්ති ට්‍රේඩර්ස්** ට ගෙවිය යුතු මුදල, 5% ක මුදල් වට්ටමකට යටත්ව සම්පූර්ණයෙන් පියවන ලදී.

(6) රු.200,000/- ක වැටුප් මුදලින් ගෙවන ලදී.

ඔබ විසින් කළ යුතු දෑ:

(a) ඉහත ගනුදෙනුවලින් පහත සඳහන් ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම **සඳහන් කරන්න**.

[මෝටර් වාහන + තොගය + වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැතියෝ) + මුදල් = ස්කන්ධය (ප්‍රාග්ධනය) + වගකීම්]

(ලකුණු 07)

(b) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාසය සඳහා ලාභය **ගණනය කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

04 වන ප්‍රශ්නය

වාමික ස්ටීල්, වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **වාමික ස්ටීල්** හි ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී:

විස්තරය	**රු.**
2025 අප්‍රේල් 01 දිනට අමුද්‍රව්‍ය තොගය	250,000
වර්ෂය තුළදී මිලට ගත් අමුද්‍රව්‍ය	6,250,000
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී	100,000
2025 අප්‍රේල් 01 දිනට නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ)	-
සෘජු වේතන	2,000,000
කර්මාන්තශාලා රක්ෂණය	120,000
විදුලිය	400,000
කුලිය	800,000
කර්මාන්තශාලා කළමනාකරුගේ වැටුප	720,000
යන්ත්‍ර නඩත්තුව	50,000
ආරක්ෂක ගාස්තු	900,000
ක්ෂය - යන්ත්‍ර සහ පිරියත	200,000
ක්ෂය - මෝටර් ලොරි රථය	100,000

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2026 මාර්තු 31 දිනට අවසාන තොග ශේෂයන්, පහත පරිදි අගය කර ඇත:

විස්තරය	**රු.**
අමුද්‍රව්‍ය (පිරිවැයට)	400,000
නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ)	200,000

(2) පහත සඳහන් වියදම්, පහත පරිදි බෙදා වෙන්කළ යුතුය:

වියදම්	**කර්මාන්තශාලාව**	**කාර්යාලය**
විදුලිය	80%	20%
කුලිය	60%	40%
ආරක්ෂක ගාස්තු	80%	20%

(3) යන්ත්‍ර හා පිරියත සහ මෝටර් ලොරි රථය, සම්පූර්ණයෙන් කර්මාන්තශාලාවේ කටයුතු සඳහා යොදවා ගනු ලබයි.

(4) නිෂ්පාදනය කළ නිෂ්පාදිත, නිෂ්පාදන පිරිවැය මත 18% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

ඔබ විසින් කළ යුතු දෑ:

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **වාමික ස්ටීල්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

05 වන ප්‍රශ්නය

රෂිඩ් ට්‍රේඩර්ස්හි සහකාර ගණකාධිකාරීවරයා විසින් 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ හර පැත්තේ රු.42,500/- ක වෙනසක් පෙන්වූ අතර, එය අවිනිශ්චිත ගිණුමකට හර කර 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.250,000/- ක ලාභයක් වාර්තාකරන ලදී. **රෂිඩ් ට්‍රේඩර්ස්,** වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යයි.

වෙනස සඳහා පහත සඳහන් හේතු, පසුව හඳුනාගන්නා ලදී:

(1) රු.80,000/- කට මුද්‍රණ යන්ත්‍රයක් මිලට ගැනීම, පරිගණක නඩත්තු ගිණුමට හර කර තිබුණි. එසේම, වර්ෂය සඳහා මුද්‍රණ යන්ත්‍රයට අදාළ වන රු.20,000/- ක ක්ෂය වාර්තා කර නොතිබුණි.

(2) රු.25,000/- ක අත්පිට ගැනුම්, ගැනුම් ගිණුමේ සටහන්කොට නොමැති නමුත්, එය නිවැරදිව මුදල් පොතේ සටහන්කොට තිබුණි.

(3) මුදලින් ගෙවූ රු.5,000/- ක ගමන් වියදමක්, ගමන් වියදම් ගිණුමේ දෙවරක් සටහන්කොට තිබුණු අතර, එය මුදල් පොතේ නිවැරදිව සටහන්කොට තිබුණි.

(4) 2025 දෙසැම්බර් මාසයේදී ගෙවන ලද රු.25,000/- ක විදුලි වියදමක්, විදුලි වියදම් ගිණුමේ රු.2,500/- ක් ලෙස වාර්තා කර තිබුණි. කෙසේවුවද, එය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(5) දෛනික විකුණුම් පොතේ එකතුව, රු.4,000/- කින් අඩුවෙන් සටහන් කර තිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි, නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් **පිළියෙල කරන්න.** (ලකුණු 05)

(b) අවිනිශ්චිත ගිණුම **පිළියෙල කරන්න.** (ලකුණු 02)

(c) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගලපන ලද ලාභය **ගණනය කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

C කොටස

(මුළු ලකුණු 20)

06 වන ප්‍රශ්නය

පවන් ට්‍රේඩර්ස්, පවන් ට අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2026 මාර්තු 31 දිනට **පවන් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

පවන් ට්‍රේඩර්ස්

2026 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම *(රු.'000)*

විස්තරය	හර	බැර
දේපල, පිරියත සහ උපකරණ - පිරිවැයට:		
ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.4,000,000/-)	8,000	
කාර්යාල උපකරණ	4,800	
මෝටර් වාහන	2,500	
2025 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:		
ගොඩනැගිල්ල		2,000
කාර්යාල උපකරණ		1,400
මෝටර් වාහන		1,250
විකුණුම්		154,000
විකුණුම් ආපසු එවුම්	2,000	
ගැනුම්	80,000	
2025 අප්‍රේල් 01 දිනට තොගය	6,000	
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	1,550	
වෙළෙඳ ගෙවිය යුතු මුදල්		1,825
බැංකු ණය මුදල		3,000
වෙළෙඳ ලැබිය යුතු මුදල්	36,000	
වැටුප් සහ වේතන	26,000	
දුරකතන ගාස්තු	450	
කාර්යාල කුලිය	4,500	
රක්ෂණ වියදම්	355	
විදුලි වියදම්	1,600	
කාර්යාල නඩත්තු වියදම්	3,050	
ආරක්ෂක ගාස්තු	770	
2025 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධන ගිණුම		14,100
එකතුව	**177,575**	**177,575**

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2026 මාර්තු 31 දිනට අවසාන තොගය, රු.3,500,000/- ක පිරිවැයකට අගය කරන ලදී.

(2) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

ගොඩනැගිල්ල	:	වර්ෂයකට 10% බැගින්
කාර්යාල උපකරණ	:	වර්ෂයකට 25% බැගින්
මෝටර් වාහන	:	වර්ෂයකට 20% බැගින්

(3) කාර්යාල නඩත්තු වියදම් තුළ, 2025 ඔක්තෝම්බර් 01 දින රු.200,000/- ක් වටිනාකමකට මිලට ගත් පරිගණකයක් ඇතුළත් වේ.

(4) 2026 මාර්තු 01 දින, වාර්ෂිකව 12% ක පොලී අනුපාතිකයක් යටතේ රු.3,000,000/- ක බැංකු ණයක් ලබාගෙන ඇත. මාස 24 ක් තුළදී ණය මුදල සම්පූර්ණයෙන් පියවීමට එකඟ විය. කාලපරිච්ඡේදය සඳහා අදාලවන පොලිය තවම බැංකුව විසින් අයකරගෙන නොමැති අතර, 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගෙවිය යුතු පොලිය, ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(5) ගනුදෙනුකරුවෙකු බුන්වත් වීම නිසා රු.1,000,000/- ක මුදලක්, බොල් ණයක් ලෙස ලියා හැරීමටත්, 2026 මාර්තු 31 දිනට, ඉතිරි වෙළෙඳ ලැබිය යුතු ශේෂයෙන් 10% ක ප්‍රතිපාදනයක් සිදුකිරීමටත් **පවන්** තීරණය කළේය.

(6) 2025/26 වර්ෂය සඳහා වන විගණන ගාස්තුව වූ රු.60,000/-, 2026 මාර්තු 31 දින වන විටත් ගෙවා නොතිබුණි.

ඔබ විසින් කළ යුතු දෑ:

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2026 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

C කොටසෙහි අවසානය

කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව			
මට්ටම	**ක්‍රියා ලැයිස්තුව**	**නිර්වචනය**	**සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්**
මතක තබා ගැනීම කරුණු,පද, මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ	හඳුනා දක්වන්න	කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම.	මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න.
	නිර්වචනය කරන්න	වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම.	පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම.
	හඳුනා ගන්න	පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය.	පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම.
	සඳහන් කරන්න	පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම.	ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකාශ කිරීම.
	ලැයිස්තුගත කරන්න	නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්.	ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම.
	සටහන් කරන්න	පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම.	අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම.
අවබෝධය තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම.	ගොඩ නගන්න	මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම.	විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම.
	වෙනස් කොට දක්වන්න	දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම.	සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම.
	විමසන්න	මාතෘකාවක් පිළිබඳව විවිධ අදහස් සහ මත සලකා බැලීම.	විවිධ දෘෂ්ටිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම.
	පැහැදිලි කරන්න	යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම.	තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම.
	ගෙනහැර දක්වන්න	කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය.	සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම.
	අර්ථකථනය කරන්න	තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම.	යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම.
	විස්තර කරන්න	යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්.	අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම.
	සාරාංශගත කරන්න	ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්.	සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම.
භාවිතය අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ.	භාවිත කරන්න.	යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම.	ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම.
	ගණනය කරන්න.	ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම.	විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම.
	තීරණය කරන්න	පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම.	ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම.
	ප්‍රදර්ශනය කරන්න.	ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම.	ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම.
	පිළියෙල කරන්න.	භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම.	කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම.
	භාවිත කරන්න	සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම.	අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම.
	ඉදිරිපත් කරන්න.	සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම.	මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම.
විශ්ලේෂණය ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම	විශ්ලේෂණය කරන්න	සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම.	වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම.
	සසඳන්න	සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම.	ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම.
	වෙනස්කොට දක්වන්න	යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම.	යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම.
	පරීක්ෂා කරන්න	යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම.	යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරීම.
	සැකිල්ලක් සේ දක්වන්න	සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.	ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම.
	ක්‍රියා කරන්න	අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම.	කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම.
	වාර්තා කරන්න	සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම.	විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම.
අගය කරන්න නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම.	උපදෙස් දෙන්න	යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම	විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම.
	අගය කරන්න	වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම.	නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම.
	සකස් කරන්න	ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම.	හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම.
	නිර්දේශ කරන්න	සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම.	තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම.
නිර්මාණය කිරීම සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව	නිර්මාණය කරන්න	අළුත් දෙයක් නිර්මාණය කිරීම.	අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම.
	තක්සේරු කරන්න	ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම.	පවතින තොරතුරු මත පදනම්ව තර්කාණුකූල විනිශ්චයන් ලබා දීම.
	සංවර්ධනය කරන්න	අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම.	කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම.
	යෝජනා කරන්න	සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම.	අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම.
	සංයෝජනය කරන්න	විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම.	විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම.
	සැලසුම් කරන්න	යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම.	නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම.
	ගොනු කරන්න	විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම.	එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම.